# ශ්‍රී ලංකාවේ පාසල් හැරයාම සම්බන්ධයෙන් බලපානු ලබන සාධක

**එම්. එල්. සී. යසින්තා**[1]

## සංක්ෂේපය

මුළු මහත් සමාජ දේහයම පෝෂණය වන්නා වූ මූල බීජය වන්නේ, අධ්‍යාපනයයි. පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානතම මාධ්‍යය ලෙස පිළිගැනෙන්නේ අධ්‍යාපනයයි. එසේ පවතින දැනුම බෙදා දීමේ ප්‍රධානතම ආයතනය වන්නේ, පාසලයි. පාසල යනු, විවිධ මට්ටම්වල දරුවන් ඒකරාශී වන ස්ථානයකි. ඒ අතර විවිධ අධ්‍යාපන මට්ටම්වලදී අධ්‍යාපනය හැර යන්නන් මේ සියලු කොටස් නියෝජනය කරයි. මෙසේ ළමුන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීම වර්තමානය වන විට ලෝකයම මුහුණ දී ඇති ගැටලුවකි. ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් පාසල් හැරයාම සම්බන්ධයෙන් බලපානු ලබන හේතු සාධක කවරේදැයි හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. සිසුන් අතරමග පාසල් අධ්‍යාපනය හැරයාම පිළිබඳ විවිධ රටවල පර්යේෂකයින් හා ශ්‍රී ලංකාවේ පර්යේෂකයින් විසින් කරනු ලැබූ පර්යේෂණ අධ්‍යයනය කිරීම මඟින් ඔවුන් විසින් සොයාගන්නා ලද පාසල් හැරයාම සඳහා බලපානු ලබන සාධක ඇසුරෙන් සමස්තයක් ලෙස මෙම ගැටලු කෙරෙහි බලපෑම් කරන්නා වූ සාධක පිළිබඳ විමසීමක් මෙමගින් සිදු කර ඇත. මේ සඳහා අවශ්‍ය ද්විතීක දත්ත පුස්තකාල හා අන්තර්ජාලය මඟින් රැස් කරගන්නා ලදී. මෙම අධ්‍යයනය මගින් පාසල් හැරයාම සඳහා බලපාන ප්‍රධානතම සාධක ලෙස ආර්ථික හා සමාජ සාධකය හඳුනාගත් අතර ඒ අනුව පවුලේ ආර්ථික පසුබිම, දෙමාපියන්ගේ ආදායම් මට්ටම හා රැකියාව ද ඊට අමතරව සමාජ පසුබිම, පවුලේ ප්‍රමාණය, සමාජ පන්තිය, දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම, දෙමව්පිය අපේක්ෂණය යන සාධකද බලපාන බව හෙළිවිය. මේ අනුව පාසල් හැරයාම හා ආර්ථික සාධක අතර ධන සම්බන්ධතාවක් පවතින බවත්, පිරිමි ළමුන් වැඩි ප්‍රතිශතයක් පාසල් හැර ගොස් ඇති බවත් හෙළිවිය. වයසින් මුහුකුරායත්ම පිරිමි ළමුන් අධ්‍යාපනයට සමු දී රැකියා කෙරේ යොමුවී ඇති බව හඳුනාගත හැකි විය. එසේම පවුලේ සංඛ්‍යාව ඉහළයාම හා දෙමව්පිය අධ්‍යාපන මට්ටම අඩුවීම හා දෙමව්පිය රැකවරණය අවම වීම මේ කෙරේ බලපානු ලබයි. ඒ අනුව පාසල් සිසුන්ගේ අධ්‍යාපනය අතරමග නතර වීමට ඔවුන්ගේ පවුලේ ආර්ථික මට්ටම හා පවුල් පසුබිම යන සාධක සෘජුවම බලපාන බව හඳුනාගත හැක.

**මුඛ්‍ය පද** : අධ්‍යාපනය, පාසල් හැරයාම, අධ්‍යාපන සාධනය, අධ්‍යාපන ගැටලු

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chathuyasintha@gmail.com